# සාධු සාධු සාධු
# සර්වඥයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!
## (කළුතර බෝධි පරිශ්‍රයේ පවත්වන දේශනාවක් හා සබැඳියි)

අපි අපේ මුළු ජීවිත කාලය පුරාම සොයන, සපුරාගන්න උත්සහකරන එක්තරා ධර්මතාවක් තියෙනවා, කුමක්ද ඒ දෙය? , ඒ ධර්මතාව....... ඒක තමයි සතුට, සැපය, සොම්නස් බව. තවත් නානාවිධ වූ වචන වලින් මෙම අදහස විස්තර කරන්න පුළුවන්.

ඇයි? සතුට, සැපය, සොම්නස් බව සපුරාගන්න උත්සහ කළ යුත්තේ, එක් වතාවක් සතුට, සැපය, සොම්නස උපදවාගෙන ස්ථිරව තබා ගත නොහැකිද? බැහැ ඒක වෙනස් වෙලා විපරිණාම වෙලා යනවා. උත්සහ කරලා, එක් වතාවක් උපදවාගෙන, ස්ථිරව තබා ගන්න පුළුවන් සැපයක් තියෙනවාද? සත්‍ය වශයෙන්ම ඔව්........... සර්වඥයන් වහන්සේ පිළිබඳ **ශ්‍රද්ධාව මුල් කොට**, පෙන්වා දී වදාළ ආර්‍යයී ප්‍රතිපදාව අනුගමනය කළ හොත් ස්ථිරවම සැපයේ පිහිටීමට පුළුවන්. ඒ අමා මහ නිවන් සුවයයි.

පෘථග්ජනයන්, අනාර්‍යයීයන් උපදවා ගන්නා සතුට, සැපය, සොම්නස් බව අනිච්චයි, අනිච්ච නම් ඒකාන්තයෙන් දුක්ඛ ධර්මතාවයක්. "යදනිච්චං තං දුක්ඛන්ති න විචිකිච්ඡාමි. යදනිච්චං දුක්ඛං විපරිණාමධම්මං"

සර්වඥයන් වහන්සේගේ ආර්‍යයී ප්‍රතිපදාව අනුගමනයෙන් පසුව, අනාර්‍යයීයන් උපදවා ගන්නා සතුට, සැපය, සොම්නස, පමණක් නොවේ, සුඛය, ප්‍රීතිය, වීර්යය,මෛත්‍රිය, කරුණාව, ශ්‍රද්ධාව, ප්‍රඥාව, දිට්ඨිය, ද්වේශය, ආදී සියළු සංස්කාර ධර්මයෝ ඒකාන්තයෙන් දුක්ඛ ධර්මතාවයට අයත් දේ බව අවබෝධය තුලින්, ස්ථිරවම සැපයේ පිහිටීමට පුළුවන්.

ඉහත අදහස් වලින් පෙනී යන්නේ දුක්ඛ ධර්මතාව යනු ආර්‍යයී නුවණකින් අවබෝධ කළ යුත්තක් බවයි.එසේ නම් ආර්ය දුක්ඛ අවබෝධය යනු, නුවණ ලැබුණු පසු ඇතිවන ධර්මතාවයක්. මේ මොහොතේ ඉන්න තැන (දැනුම මත) ඉඳලා මෙම ගමන ආරම්භ කරන ආකාරය දැනගැනීමයි අවශ්‍ය වෙන්නේ. ඉන්න තැන, වැටහෙන තැන ඉඳලා විවරණය සැලකුවහොත්, අපට **විද්‍යාමාන දුකක් තියෙනවා** ඒ දුක හට ගන්න හැටි/ උදය වන හැටි/ සමුදය වන හැටි, නුවණින් මෙනෙහි කිරීමයි සිදුකළ යුත්තේ.

සර්වඥයන් වහන්සේගේ ධර්මය ඇසුරු කරන විට සෑම ප්‍රශ්නයක් සඳහාම විසඳන ක්‍රමවේදයක් තිබෙනවා. අපට එම ක්‍රමවේදය සර්වඥයන් වහන්සේ පෙන්වා දෙනවා.

1. ප්‍රශ්නය
2. ප්‍රශ්නයට හේතු
3. ප්‍රශ්නයේ හේතු නැති කිරීම
4. හේතු නැති කරන ක්‍රමවේදය

ප්‍රශ්නය තමයි දුක, දුක හොඳින් විමසන්නට පිරිසිඳ දකින්නට අවශ්‍යයි. දුක පිරිසිඳ දකිනවාත් සමගම ඉතිරි ප්‍රශ්න තුනටත් පිළිතුරු ලැබෙන බව සත්‍යයක්.

මේ මොහොතට, ඉන්න තැන අනුව **දුක** දැනෙන - විඳින ධර්මතාවක් විද්‍යාමාන දෙයක්. ඒ දුක දැනගන්නේ කොහොමද? සිතින්/ විඤ්ඤාණයෙන්.

දුක යනු තනිව උපදින සදාතනික (නිච්ච,සාස්වත, අවිපරිණාම) ධර්මයක්ද? නැහැ. දුක යනු සකස් වන සංඛත, විපරිණාම ධර්මතාවයක්.

දුක ප්‍රභේද වශයෙන් මොනවාද?

1. කායික දුක -විපාක වශයෙන් කයට ලැබෙන දුක
2. චෛතසික දුක - සිතින් හදල ගන්න දුක

කායික දුක අතීත කර්ම ශක්තියටම උපදින නිසා එම දුක අවබෝධ කරගැනීමට තරමක් දුෂ්කරයි. මෙම කායික දුක්ඛය හේතුවෙන් චෛතසික දුක්ඛ ඇතිවෙනවා.මේ උපදින චෛතසික දුක්ඛය දකින්න නුවණ භාවිතා කිරීම පහසුයි.

චෛතසික දුක හෙවත් සිතින් හදලා ගන්න දුක, වර්තමානයේ සකස් වෙන බව,මේ මොහොතේ පෙන්වාදීමෙන් දුක අවබෝධ කරගන්න පහසුයි.

සිතෙන් හදන දුකට හේතුව කුමක්ද? තණ්හාව, ඡන්දරාගය, කැමැත්ත, ආදී ධර්මතා, **දුව, පුතා, ගෙවල් දොරවල්, යාන වාහන ආදී** කාම වස්තු/අරමුණු, ඇසුරු කොට උපදිනා නිසා තමයි දුක උපදින්නේ.

<u>තමාගේ කැමැත්තට එම කාම වස්තු හමුවෙන කොට, සිතේ **සැප විඳීමක්** ඉපදිලා, සිත දැනගන්නවා **සැපයි** කියලා. තමාගේ කැමැත්තට, එම කාම වස්තු හමුනොවෙන කොට, සිතේම **දුක් විඳීමක්** ඉපදිලා සිතම</u>

දැන ගන්නවා **දුකයි** කියලා. සිත, විඤ්ඤාණය, මායාකාරයෙක්, සිත තමාව රවටනවා, මුලාවට පත්කරනවා. සිතේම උපදින අඳුරක් (අවිද්‍යා අන්ධකාරය) නිසා අපට දුක උපදින ආකාරය පිළිබඳ අවබෝධයක් නෑ. සිත ගැන කලකිරිලා, කාම වස්තු උදෙසා විරාගය උපදවා ගතහොත්, සිතේ විද්‍යා ආලෝකය පහල වෙනවා, සිත අවබෝධ වෙනවා, දුක අවබෝධ වෙනවා, මේ ආකාරයට දුක් විඳීමෙන් නිදහස් වෙනවා.

දැන් තිබෙන මූලික ගැටළුව **දුක**. දුකට හේතුව තණ්හාව. තණ්හාවට හේතුව විඳීම (වේදනාව). විඳීම කුමක් සඳහාද? කාම අරමුණු (සංකල්ප) සඳහා. මෙසේ කාම අරමුණු, කාම සංකල්පනාවලට විඳිනවිට තණ්හාව ඉපදිලා **කාමය** උපදිනවා. කාමය උපදින්නේත් සිතේමයි. මේ සිතේ ඉපදීමට කියනවා කාම ලෝකය ඉපදුනා කියලා.

දුක මූලික මාතෘකාව නිසා, දුකට හේතුව තණ්හාව ලෙස යෙදුවට තණ්හාවට හේතුව, දුක (සැප) කියලා යොදන්නත් පුළුවන්.තණ්හාවට හේතුව විඳීම, විඳීමට හේතුව තණ්හාව කියලා යොදන්න පුළුවන්.

***දුක ⇌ තණ්හාව***

***තණ්හාව ⇌ විඳීම (කාම අරමුණු)***

මේ නිසා, මේ සියළු ධර්මතා සංඛත, සංස්කාර කියලා ධර්මයේ හදුන්වනවා. මේ ධර්මතා හේතු ප්‍රත්‍යයෙන් උපන් බව, පටිච්චසමුප්පන්න වන බව, ප්‍රත්‍ය සාමාග්‍රයකින් උපදින බව සිහිකල යුතුයි.

## කාමගුණ, කාම අරමුණු හා කාමය(පංචකාමය)

බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ ය කාම ගුණ සහිත ධර්මතාවයෝය. කාමගුණ සහිත මෙම ධර්මතා සිතින් ගත්විට කාම අරමුණක් වේ. කාම අරමුණුවලට තණ්හාවෙන් බැඳීගිය පසු පංච කාමය, පස්කම් සැපය උපදී. මෙම උපදින කාම සැපය නිච්ච, සුඛ, අවිපරිණාම දෙයක් ලෙස ගන්නා නිසා සත්වයා සසරට බැඳීයයි. කම් සැපය සංඛතයක්, සකස්වන දෙයක්, අනිච්ච ධර්මතාවක්, විපරිණාම ධර්මතාවක්, පංචඋපාදානස්කන්ධයක් ලෙස නොගනී.

# කාමගුණය, කාමය(පංචකාමය) බවට පත්වීම

බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යන කාම ගුණ ඇස... ආදි ඉන්ද්‍රියන්ට පැමිණි පසු කම් සැපය අහේතුකව හටනොගනී හේතු ඵල දහම හෙවත් පටිච්චසමුප්පාදය අනුවම සිදුවන්නක්. මෙතෙක් සසරේ කාමගුණ කම්සැප බවට පත්කරන ලද ගුණය (අනුශ ආදි....) චිත්තසංතානයේ තිබෙන තුරු වර්තමානයේ ලැබෙන කාමගුණ, කම්සැපයක් බවට අනාත්මීයවම පත්වේ. ආසව, ඕඝ, යෝඝ, ග්‍රන්ථ, නීවරණ ආදී හේතු වදාරණ ලද්දේ මෙම සිද්ධිය පහදා දීමටයි. චිත්තසංතානයේ ආසව ආදී ගති උපදිනතුරු කම්සැප උපදී. මේ ආකාරයට පෙර පුරුදුගතියෙන් වර්තමාන උපදින ගතිය විපල්ලාස කරවයි. මේ ආකාරයට කාමගුණ, කාමසංකල්පයක් විදියට සකස්කරලා දෙනවා. කාම සංකල්පනාවට තණ්හාවෙන් බැඳිලා දුක/සැප උපදවනවා.

## නිබ්බේධික සුත්තං

අඞ්ගුත්තරනිකායො6. >ඡක්කනිපාතො2.<දුතියො පණ්ණාසකො>මහාවග්ගො

*(1) "කාමා භික්ඛවේ වේදිතබ්බා, කාමානං නිදානසම්භවෝ වේදිතබ්බෝ, කාමානං වේමත්තතා වේදිතබ්බා, කාමානං විපාකෝ වේදිතබ්බෝ, කාමනිරෝධෝ වේදිතබ්බෝ, කාමනිරෝධගාමිනී පටිපදා වේදිතබ්බා"ති. ඉති ඛෝ පනේතං වුත්තං. කිඤ්චේතං පටිච්ච වුත්තන්ති.*

*1. 'මහණෙනි, කාමයෝ දත යුත්තාහු ය. කාමයන්ගේ පසුබිම හටගන්නා අයුරු දත යුත්තේ ය. කාමයන්ගේ විවිධත්වය දත යුත්තේ ය. කාමයන්ගේ විපාකය දත යුත්තේ ය. කාමයන් නිරුද්ධ වීම දත යුත්තේ ය. කාමයන් නිරුද්ධ වන්නා වූ ප්‍රතිපදාව දත යුත්තේ ය.' යනුවෙන් යමක් කියන ලද්දේ නම්, එය කවර කරුණක් අරභයා කියන ලද්දේ ද යත්;*

*පඤ්චිමේ භික්ඛවේ කාමගුණා: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සෝතවිඤ්ඤෙය්‍යා සද්දා ....(පෙ).... ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා....(පෙ).... ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා....(පෙ).... කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. අපි ච ඛෝ භික්ඛවේ නේතේ කාමා, කාමගුණා නාමේතේ අරියස්ස විනයේ වුච්චන්ති.*

*මහණෙනි, මේ කාම ගුණයෝ පසකි. ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ, ප්‍රිය ස්වභාව ඇති, කැමැත්ත ඇතිවෙන, කෙලෙස් ඇතිවෙන, ඇසින් දත යුතු රූපයෝ ය. කනින් දත යුතු ශබ්දයෝ ය ....(පෙ).... නාසයෙන් දත යුතු ගන්ධයෝ ය. ....(පෙ).... දිවෙන් දත යුතු රසයෝ ය. ....(පෙ).... ඉෂ්ට වූ, කාන්ත වූ, මනාප වූ, ප්‍රිය ස්වභාව ඇති, කැමැත්ත ඇතිවෙන, කෙලෙස් ඇතිවෙන, කයින් දත යුතු ස්පර්ශයෝ ය. මහණෙනි, නමුත් මේවා කාමයෝ නොවෙති. ආර්ය විනයෙහි මේවා කාම ගුණ යැයි කියනු ලැබේ.(ගාථාවකි)*

*සංකප්පරාගෝ පුරිසස්ස කාමෝ*
*නේතේ කාමා යානි චිත්‍රානි ලෝකේ*
*සංකප්පරාගෝ පුරිසස්ස කාමෝ*
*තිට්ඨන්ති චිත්‍රානි තථේව ලෝකේ*
*අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දන් ති*

*පුරුෂයාගේ කාමය යනු සංකල්ප රාගයකි. ලෝකයෙහි විසිතුරු අරමුණු වෙත් ද, ඒවා කාමයෝ නොවෙති. පුරුෂයාගේ කාමය යනු සිතුවිලිවල හටගන්නා රාගය යි. ලෝකයෙහි විසිතුරු අරමුණු ඒ අයුරින් ම තිබෙයි. එහෙත් නුවණින් එඩිතර වූවෝ ඒ කෙරෙහි ඇති ආශාව දුරලති.*

## සංකල්පයක් සිතේ ඉපදීම හා නිරෝධය

උදාහරණ: මල, ඇපල්, අම්මා, තාත්තා

සංකල්පයක් ඉපදීමට හේතුව ආසව (අවිද්‍යා ආසව). මෝඩ කමට සකස් කරන ලද සංකල්ප නිසා සසර (කාමලෝක උපත). මේ උපදින සියළු ධර්මතා රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ඇස..... ආදී (18 ම) උපදින්නේ අවිද්‍යා ප්‍රත්‍යයෙන්මයි. අවිද්‍යා ප්‍රත්‍යයෙන් උපදින සෑම ධර්මතාවක්ම **අනිච්චයි**. අනිච්ච නම් දුකයි. හේතු ඵල අංගයෝම (පටිච්චසමුප්පාද) අනිච්චයි,දුකයි. අනිච්ච ධර්මතා උපදිනවාත් සමග අන්ත ඇසුරක් යෙදිලා, සාපේක්ෂ භාවයක් ඉපදිලා අතීතානාගත ප්‍රත්‍යුත්පන්න, ආධ්‍යාත්මික, බාහිර, ඖදාරික, සූක්ෂම, හීන, ප්‍රණීත ලෙස විපල්ලාස දැනගැනීම් පහල වෙනවා. මෙම විපල්ලාස ධර්මතා තමයි කම්සැප කියන්නේ. මේ ආකාරයට කම්සැපයත්, එම ධර්මතා සමුදය කරන සියළු ධර්මතාත් අනිච්චයි. සසර නූපදීමට නම් විද්‍යාව යොදලා නුවණින් හේතු ඵල දහම අනුව සකස්වන බව පෙන්වන්න වෙනවා.මෙසේ වර්තමානයේ සකස්වන සංකල්පයේ සත්‍යයත්,

තණ්හාව නිසා උපදින කම්සැපය හෙවත් පංචඋපාදානස්කන්ධයේ සත්‍යයත් පෙන්වන්න වෙනවා. මේ හේතු නිසා සංකල්ප හා තණ්හාව උපදින බවත්, මේ හේතු නොහට ගැනීමෙන් සංකල්ප, තණ්හා නූපදින බවත් නුවණින් සිතට පෙන්විය යුතු වෙනවා. මේ විද්‍යාවේ උදාවීම (යෝනිසෝමනසිකාරය) නිසා ආසව ගෙවීයන අතර තණ්හාව හටනොගෙන සිත නිරෝධයට යනවා.

## <u>මේ ආකාරයට දුක උපදින ආකාරය බලමු</u>

අවිද්‍යා (ආසව) නිසා සංකල්ප (සංස්කාර)
සංකල්ප නිසා තණ්හා
තණ්හා නිසා උපදාන...........

ඉහත ධර්මතා මනා කොට ඇසුරු කර, මනසිකාර කර (දර්ශනඥාණය ඇති කරගෙන) ධර්මතා 18 හි ක්‍රියා ස්වභාවය විද්‍යාමාන අවස්ථාවේදී හේතුව යෙදීමම, ඵලය වේ, **හේතු ඵල වෙන් කළ නොහැකි** බව අවබෝධ කර ගැනීමෙන් (ත්‍රිලක්ෂණ අවබෝධය) මේ **මොහොතේදීම**, යම් තැනක උපදින්නෙ නැති, දිරන්නෙ නැති, මැරෙන්නෙ නැති, චුත වෙන්නෙ නැති, යළි උපදින්නෙ නැති, ඒ ලෝකයේ කෙළවරට යා හැකි බව ඒකාන්ත සත්‍යයකි. සතිය හා නුවණ ඇති යමෙකුට, ඒ අමා මහ නිවන් සුවය වැඩි ඈතක නොවේ.

## සර්වඥයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

# සටහන්

## නිවන් මග උදෙසා දර්ශන ඥාණය

**Join Zoom Meeting** (සෑම සෙනසුරාදාම සවස 4.00 - 7.00 දක්වා)

**Meeting ID: 899 1349 3367     Passcode: 100100**

**Youtube: Way To Nibbana     WEB SITE: www.waytoni.com**

## මුල සිට ධර්ම පන්ති ආරම්භය

**කළුතර බෝධි පරිශ්‍රය - නිවන් මග උදෙසා දර්ශන ඥාණය**

**2025-01-12** සවස 2.00 සිට 4.00 දක්වා

**පොල්ගස්ඕවිට - නිවන් මග උදෙසා දර්ශන ඥාණය**

**නව ධර්ම පන්තියට ලියාපදිංචි වීම සඳහා**

**පහත අංකයට ඔබගේ නම, ලිපිනය සහ දුරකථන අංකය දැනුම් දෙන්න.**

Whatsapp අංකය - **0777 047174**